# 2022 ජූලි මස 19 වන දින ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභා රැස්වීම් වාර්තාව

දිනය සහ වේලාව :- 2022.07.19 පෙ.ව. 09.30

ස්ථානය :- ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව

පැමිණීම:-

| | |
|---|---|
| 01. ජී.ජී.ජී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති |
| 03. ආර්.පී. ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 08. චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 10. සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 11. ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 18. එස්.පී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. රාජකුමාර් විදුෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 20. එන්.එම්. නන්දාවතී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 21. ආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 02. එච්.පී. ආනන්ද කුලතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

නොපැමිණීම:-

| | |
|---|---|
| 05. ඩී.ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07. ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 09. ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

| | |
|---|---|
| 13. ආර්.එම්. චාමික අනුරාධ රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 01. එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

<u>ගරු සභාපතිතුමා</u>

ගරු සභාපතිතුමා විසින් මහා සභා රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් සියලුදෙනා හා පැමිණ සිටි අනෙකුත් සියලුදෙනාම ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී.

සභා රැස්වීමට සහභාගීවූ සියල්ලෝම තම ආගම සිහිකර ජාතික ගීය ගායනා කිරීමෙන් පසුව මියගිය රණවිරුවන් හා මියගිය පළාත් පාලන ආයතන නියෝජිතයින් සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වන ලදී. ඉන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් න්‍යායපත්‍රානුකූලව පසුගිය සභා වාර්තාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

<u>01.පසුගිය සභා වාර්තාව සම්මත කර ගැනීම</u>

2022 ජූනි මස 21 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කර ගැනීමට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

පෙරවරු 9.45ට ගරු මන්ත්‍රී ඩබ්.අයි.එස්. පතිරණ මහතා ගරු මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය සභා ගර්භයට පැමිණෙන ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා</u>

මූලාසනයේ ගරු සභාපතිතුමනි,පසුගිය සභාවාරයේ මා විසින් අසුපිනිඇල්ල ව්‍යාපෘතිය ආරම්භ කර වසරක් පමණ වුවත් එහි තිබෙන ලක්ෂ හයක් පමණ වටිනා කොන්ක්‍රීට් කණු සභාවට රැගෙන ඒම සම්බන්ධයෙන් සිදුකරන ලද ප්‍රකාශය පසුගිය සභා වාර්තාවේ පිටු අංක 4 හි සඳහන් වියයුතුයි.

<u>ගරු සභාපතිතුමා</u>

වෙනත් සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා. එසේ නොමැතිනම් පසුගිය සභා වාර්තාව සම්මත කිරීම සුදුසුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි</u>

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2022.06.21 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට මම යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය</u>

එම යෝජනාව මම ස්ථිර කරමි.

යෝජනා ස්ථිරත්වයෙන් අනතුරුව 2022.06.21 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

<u>02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - ඇත</u>

01. ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන ඊ - නැණ පියස පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු උපදේශක තනතුර සඳහා 2022-06-06 දින පැවති සම්මුඛ පරීක්ෂණය මගින් අංක 113, පරගල, උඩහේන්තැන්න ලිපිනයෙහි පදිංචි කේ. ආර්. දිමුතු මධුශංක කලංසූරිය මහතා තෝරා පත්කර ගනු ලැබූ අතර 2022-07-04 දින සිට පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු පාඨමාලා නැවත ආරම්භ කරන ලද බව නිවේදනය කරමි.

02 .නඩත්තු /හදිසි හා අලුත්වැඩියා කොන්ත්‍රාත්කරුවකුට පැවරිය හැකි එක් කොන්ත්‍රාත්තුවක පෙර පැවති වටිනාකම වන රු.මිලියන 03ක මුදල රු.මිලියන 05ක් ලෙස ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය පරිදි සංශෝධනය කළ බව දන්වමින් පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් ඉදිරිපත් කළ ලිපිය සභාගත කරමි.

03. වර්තමාන අභියෝග හමුවේ දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය මගින් ජනතාව වෙත සපයනු ලබන සේවාවන් පුළුල් කිරීම සඳහා සියලු රෝහල් ඇතුළු සෞඛ්‍ය මධ්‍යස්ථානවලට අවශ්‍ය ඖෂධ හිඟයකින් තොරව සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍යවරුන් මගින් ලබාදෙන සේවාවන් ද තවදුරටත් සම්පව ලබාදීම සඳහා ඔවුන් මෙහෙයවන ලෙසත් හැකි උපරිම පහසුකම් ඔවුන් වෙත සලසා දෙන ලෙසත් දන්වමින් පළාත් පාලන කොමසාරිස් විසින් ඉදිරිපත් කළ ලිපිය සභාගත කරමි.

<u>03. සභාවට ලැබී ඇති සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන - නැත</u>

<u>04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත</u>

<u>05.යථා පරිදි කල්දී ඇති යෝජනා - ඇත</u>

<u>05:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

<u>05:01:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.</u>

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව තුළ දැනට පවතින තක්සේරුකරුවන්ගේ හිඟය හේතුවෙන් එම දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා උපාධිය ලබා සිටින උපාධිධාරීන් පළාත් පාලන ආයතන වලට කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තක්සේරු කටයුතු නිම කරගත හැකි බවට පළාත් පාලන කොමසාරිස් විසින් පළාත් සභා සහ පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය දැනුවත් කර ඇත. ඒ අනුව අප පළාත් පාලන ආයතනයේ තක්සේරු කටයුතු කඩිනමින් සිදුකර ගැනීම සඳහා මෙම දැනුවත් කිරීම පරිදි තක්සේරු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වෙමින් ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් ලබා ගන්නා ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය විසින් දන්වා ඇත. ඒ අනුව අප බල ප්‍රදේශයේ තක්සේරු කර ගැනීමට අවශ්‍ය දේපල කඩිනමින් හඳුනාගෙන ඒවා නිවැරදිව තක්සේරු කර ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා උපාධිය ලබා සිටින උපාධිධාරීන් කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තක්සේරු කටයුතු නිම කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. පී. ප්‍රසන්න විමල් මනතුංග මහත</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව තුළ දැනට පවතින තක්සේරුකරුවන්ගේ හිඟය හේතුවෙන් එම දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා උපාධිය ලබා සිටින උපාධිධාරීන් පළාත් පාලන ආයතන වලට කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තක්සේරු කටයුතු නිම කරගත හැකි බවට පළාත් පාලන කොමසාරිස් විසින් දැනුවත් කර තිබෙන අතර ඒ අනුව අප බල ප්‍රදේශයේ තක්සේරු කර ගැනීමට අවශ්‍ය දේපල කඩිනමින් හඳුනාගෙන ඒවා නිවැරදිව තක්සේරු කර ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා උපාධිය ලබා සිටින උපාධිධාරීන් කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තක්සේරු කටයුතු නිම කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.මේවන විට දියුණු කළ ප්‍රදේශ වශයෙන් හඳුනාගෙන තිබෙන කුරුඳුවත්ත,ඇත්ගාල,ගම්පොළවෙල ආදී ප්‍රදේශවලින් වරිපනම් බදු අයකර සභාවේ ආදායම වැඩි කිරීමට අපේක්ෂා කළද ඒ සඳහා අදාළ දේපළ තක්සේරු කරගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුවේ පවතින තක්සේරුකරුවන්ගේ හිඟතාවය බලපා තිබෙනවා. කුරුඳුවත්ත,ඇත්ගාල ප්‍රදේශ ගත්විට විශාල සංවර්ධනයක් එම ප්‍රදේශවල සිදුවී තිබෙන නමුත් වරිපනම් අයකෙරෙන්නේ දොළොස්බාගේ ,උලපනේ සහ රාක්ෂාව ප්‍රදේශවල පමණයි. එම ප්‍රදේශවල දේපළ තක්සේරු කිරීමේ කාර්යය සඳහා මෙය වටිනා අවස්ථාවක් ලෙස හඳින්විය හැකියි.මේ සම්බන්ධයෙන් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ තවම නිශ්චිතව නොදන්නා අතර මෙම යෝජනාව සඳහා මහා සභා තීරණයක් ලබාගෙන තක්සේරු දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු මහා සභාවට එම තොරතුරු ඉදිරිපත් කළ හැකියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි,වර්තමානයේ දියුණු කළ ප්‍රදේශ වශයෙන් හඳුනාගෙන ඇති කුරුඳුවත්ත හා ඇත්ගාල අවට පැල්ලපිටිය,ගිරාඋල්ල වැනි ප්‍රදේශ සුවිශේෂ ආදායම් මාර්ගයක් ඇති කළ හැකි ප්‍රදේශ ලෙස හැඳින්විය හැකියි. තක්සේරු නිලධාරීන්ගේ හිඟය නිසා අපට එය වසර ගණනාවක් පුරා මගහැරී තිබෙනවා.පළාත් පාලන ආයතනවලට අවශ්‍ය දේපළ තක්සේරු කරදීම රජයේ වගකීමයි.නමුත් රටේ පවතින තත්ත්වයත් තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු නිලධාරීන්ගේ හිඟය නිසාත් අදාළ පළාත් පාලන ආයතනයෙන් මුදල් ගෙවීම් සිදුකර අදාළ උපාධිධාරීන්ගෙන් සේවය ලබාගැනීමට අපට මෙම අවස්ථාව ලබා දී තිබෙනවා.එම නිලධාරීන්ට වැටුප් ගෙවීම සිදුකරන ආකාරය ,කොන්ත්‍රාත් කාලසීමාව මෙම තක්සේරුකරණය අනාගතයේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් පිළිගනීද යන්න පිළිබඳව විශේෂ වාර්තාවක් ගරු මහා සභාව වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා

ගරු සභාපතිතුමනි,තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ක්‍රියා පටිපාටියකට අනුව එම බඳවා ගැනීම් ,වැටුප් ගෙවීම් සිදුකෙරෙනු ඇතැයි මා සිතනවා.මෙය වසර ගණනාවක් පුරා දිගින් දිගට ඇදී ආ ගැටළුවක් වන නමුත් මින් පෙර මෙවන් අවස්ථාවක් අපට ලැබී නොමැති අතර මෙම අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගෙන හැකි ඉක්මණින් දේපළ තක්සේරුව සිදුකිරීම සුදුසුයි.

තීරණය:-

ඒ අනුව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව තුළ දැනට පවතින තක්සේරුකරුවන්ගේ හිඟය හේතුවෙන් එම දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා උපාධිය ලබා සිටින උපාධිධාරීන් පළාත් පාලන ආයතන වලට කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තක්සේරු කටයුතු නිම කරගත හැකි බවට පළාත් පාලන කොමසාරිස් විසින් පළාත් සභා සහ පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යංශය දැනුවත් කර ඇත. ඒ අනුව අප පළාත් පාලන ආයතනයේ තක්සේරු කටයුතු කඩිනමින් සිදුකර ගැනීම සඳහා මෙම දැනුවත් කිරීම පරිදි තක්සේරු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වෙමින් ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් ලබා ගන්නා ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය විසින් දන්වා ඇත. ඒ අනුව අප බල ප්‍රදේශයේ තක්සේරු කර ගැනීමට අවශ්‍ය දේපල කඩිනමින් හඳුනාගෙන ඒවා නිවැරදිව තක්සේරු කර ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණ හා

තක්සේරු විද්‍යා උපාධිය ලබා සිටින උපාධිධාරීන් කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තක්සේරු කටයුතු නිම කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදී.

ගම්පොළ නගර සභා බල ප්‍රදේශයෙන් බැහැර කරනු ලබන කසළ සතියට දින තුනක් අප සභාව සතු ඩෙන්මාර්ක් කසළ අංගනය වෙත ලබා ගන්නා අතර එසේ ලබා ගන්නා කසළ කිලෝග්‍රෑම් 01ක් රුː 1.00 බැගින් ටොන් එකක් සඳහා රුː1000.00 ක මුදලක් අය කරනු ලබයි. එහෙත් වර්තමානයේ පවතින ඉන්ධන සහ අනෙකුත් වියදම් දෙස බැලීමේදී අප විසින් අය කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවන හෙයින් ගම්පොළ නගර සභාව මගින් අප වෙත ලබා දෙන කසළ කිලෝග්‍රෑම් එකක් රුː 3.00 බැගින් ටොන් එකක් සඳහා රුː3000.00ක මුදලක් අය කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මසකට ගම්පොළ නගර සභා බල ප්‍රදේශයෙන් බැහැර කරනු ලබන කසළ ටොනු 40 කට වැඩි ප්‍රමාණයක් අප සභාව සතු ඩෙන්මාර්ක් කසළ අංගනය වෙත ලබා ගන්නා අතර එසේ ලබා ගන්නා කසළ කිලෝග්‍රෑම් 01ක් රුː 1.00 බැගින් ටොන් එකක් සඳහා රුː1000.00 ක මුදලක් අය කරනු ලබන නමුත් වර්තමානයේ පවතින ඉන්ධන සහ අනෙකුත් වියදම් දෙස බැලීමේදී අප විසින් අය කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවන හෙයින් ගම්පොළ නගර සභාව මගින් අප වෙත ලබා දෙන කසළ කිලෝග්‍රෑම් එකක් රුː 3.00 බැගින් ටොන් එකක් සඳහා රුː3000.00ක මුදලක් අය කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

රසායනික පොහොර ගැටළුව සම්බන්ධයෙන් වත්මන් ජනාධිපතිතුමා ඉදිරිපත්කර ඇති විසඳුම අනුව කාබනික පොහොර සම්බන්ධව ගැටළුවක් ඇතිවිය හැකියි.සභාවටත් අලාභයක් නොවන පරිදි කසල කපන යන්ත්‍රය අළුත්වැඩියා කරගනිමින් මෙම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාම සුදුසුයි.

පෙරවරු 10.05ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී රාජකුමාර් විදුෂණී මහත්මිය සභා ගර්භයට පැමිණෙන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි,මෙම යෝජනාව අනුව කසළ කිලෝග්‍රෑම් එකක් රුː 3.00 බැගින් අයකිරීම සුදුසු බව මාගේ අදහසයි.

තීරණය:-

ඒ අනුව ගම්පොළ නගර සභා බල ප්‍රදේශයෙන් බැහැර කරනු ලබන කසළ සතියට දින තුනක් අප සභාව සතු ඩෙන්මාර්ක් කසළ අංගනය වෙත ලබා ගන්නා අතර එසේ ලබා ගන්නා කසළ කිලෝග්‍රෑම් 01ක් රුː 1.00 බැගින් ටොන් එකක් සඳහා රුː1000.00 ක මුදලක් අය කරනු ලබයි. එහෙත් වර්තමානයේ පවතින ඉන්ධන සහ අනෙකුත් වියදම් දෙස බැලීමේදී අප විසින් අය කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවන හෙයින් ගම්පොළ නගර සභාව මගින් අප වෙත ලබා දෙන කසළ කිලෝග්‍රෑම් එකක් රුː 3.00 බැගින් ටොන් එකක් සඳහා රුː3000.00ක මුදලක් අය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

උලපනාවත්ත සමගි ග්‍රාම සංවර්ධන / සුභ සාධක සමිතියට අයත් ප්‍රජාශාලා භූමිය ප්‍රාදේශිය සභාවට ලබාදීමට 2022.07.04 වන දිනැති ලිපියෙන් එකඟතාවය ලබා දී ඇත. මෙම ඉඩම පර්චස් 05කි. එම ඉඩම ප්‍රාදේශීය සභාවට නීත්‍යානුකූලව පවරා ගැනීමට හා එහි ඔප්පු ලියාපදිංචි ගාස්තු සභාව මගින් දැරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපතිතුමා

මෙම ඉඩම පෞද්ගලික හිමිකාරීත්වයක් සහිතව තිබූ ඉඩමක් වන අතර පසුව ඔප්පුවක් මගින් උලපනාවත්ත සමගි ග්‍රාම සංවර්ධන / සුභ සාධක සමිතියට ලබා දී තිබෙනවා.ඒ අනුව දැනට මෙම පර්චස් 05ක ඉඩම ප්‍රාදේශිය සභාවට අයත් ඉඩමක් නොවන නිසා එහි ප්‍රජා ශාලාවක් ඉදිකිරීමට ප්‍රාදේශිය සභාවට හැකියාවක් නොමැති බැවින් ඉඩම සභාවට පැවරිය යුතුයි.ගරු අජිත් මන්ත්‍රීතුමා එතුමාට වෙන්කර ඇති ප්‍රතිපාදනවලින් රුපියල් ලක්ෂ පහක් වැය කර සියයට විසිපහක ශ්‍රමදායකත්වය යොදාගෙන ප්‍රජා ශාලාව සෑදිමට එකඟතාවය පළ කර තිබෙනවා.උලපනාවත්ත සමගි ග්‍රාම සංවර්ධන / සුභ සාධක සමිතිය විසින් 2022.07.04 වන දිනැති ලිපියෙන් මෙම ඉඩම ප්‍රාදේශිය සභාවට ලබාදීමට එකඟතාවය ලබා දී ඇත. ඉඩම ප්‍රාදේශීය සභාවට නීත්‍යානුකූලව පවරා ගැනීමට හා එහි ඔප්පු ලියාපදිංචි ගාස්තු සභාව මගින් දැරීමට සිදුවන නමුත් මෙම ඉඩම් කොටසේ එක් පර්චසයක් රුපියල් ලක්ෂ දෙකක පමණ වටිනාමකින් යුක්තයි. එම ඉඩම ප්‍රාදේශිය සභාවට නීත්‍යානුකූලව පවරා ගැනීමට හා එහි ඔප්පු ලියාපදිංචි ගාස්තු සභාව මගින් දැරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

මූලාසනයේ ගරු සභාපතිතුමනි,පළාත් පාලන අයතනයකට තමන් හිමිකම් නොකියන ඉඩමක සංවර්ධන කටයුත්තකට මුදල් යෙදවිය නොහැකියි .එම නිසා සභාවට පවරා දී සභා අරමුදලින් ප්‍රජාශාලාව ඉදිකරවා ගැනීමට කටයුතු කර තිබෙනවා.ප්‍රාදේශිය සභා පනත අනුවත් කටයුතු කළ හැක්කේ ඒ ආකාරටයි.ගම්වැසියන්ට ප්‍රජා ශාලාවක් අවශ්‍ය බැවින් ඔවුන්ගේ ඉල්ලීම සාධාරණයිතැඹිලිගල සුසාන භූමියෙන් සියයට අනුවක්,වැටකේදෙණිය සුසාන භූමියෙන් සියයට හැත්තෑවක් පමණ හා දොළොස්බාගේ සුසාන භූමියේ සම්පූර්ණ භූමිය ම අල්ලාගෙන තිබෙනවා. පැල්ලපිටිය ප්‍රජා ශාලාවෙන් සියයට තිහක් හා මල්වත්තගම ප්‍රජා ශාලාව අල්ලාගෙන තිබෙනවා.එසේම බල ප්‍රදේශයේ තිබෙන සුසාන භූමි සහ ප්‍රජා ශාලා ප්‍රාදේශිය සභාවට පවරා ගැනිමට කටයුතු කිරීම අත්‍යවශ්‍යයි.සමස්ත බල ප්‍රදේශයේම භූමිය සභාවට පවරනවානම් සභාව මගින් ඔප්පු සකස්කර විධිමත්ව පවත්වාගෙන යාමට නිත්‍යානුකූල රාමුවක් තුළ එකඟතාවයක් ඇතිකර ගැනීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

සුසාන භූමි සහ ප්‍රජා ශාලා මැනීම සම්බන්ධයෙන් කටයුතු කෙරෙමින් පවතින අතර මේවන විට ඉතිරිව ඇත්තේ සියයට විසිපහක් පමණයි.ඒ සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයෙන් මැනුම් නියෝග ලබා ගත යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

ගරු සභාපතිතුමනි,ගමට ප්‍රජා ශාලාවක් අවශ්‍ය නමුත් සභාවට අයිති දේපළක් නොවන බැවින් මේ සඳහා සභාවට මැදිහත් විය නොහැකි බව පසුගිය නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුවේදී මේ සම්බන්ධව සාකච්ඡා කෙරුණා.ග්‍රාම සංවර්ධන සමිතියෙන් එවැනි ඉදිකිරීමක් කිරීමට නොපෙළඹෙන නිසා සභාවට ඉඩම පවරා දීමට කටයුතු කිරීමට කැමැත්ත පළ කර තිබෙනවා.කුමන ප්‍රතිපාදන මගින් ඉදිකිරීම සිදුකළ ද එය සභාවට අයත් භූමිය තුළ සිදුකරන බැවින් එහි අයිතිය හිමිවන්නේ සභාවටයි.ඉදිරියටත් මෙවැනි යෝජනා ඉදිරිපත්වන විට ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම කළ හැකියි.එමනිසා මෙම ඉඩම ප්‍රාදේශිය සභාවට නීත්‍යානුකූලව පවරා ගැනීමට හා එහි ඔප්පු ලියාපදිංචි ගාස්තු සභාව මගින් දැරීම සුදුසුයි.

තීරණය:-

ඒ අනුව උළපනාවත්ත සමගි ග්‍රාම සංවර්ධන / සුභ සාධක සමිතියට අයත් ප්‍රජාශාලා භූමිය ප්‍රාදේශීය සභාවට ලබාදීමට 2022.07.04 වන දිනැති ලිපියෙන් එකඟතාවය ලබා දී ඇත. මෙම ඉඩම පර්චස් 05කි. එම ඉඩම ප්‍රාදේශීය සභාවට නීත්‍යානුකූලව පවරා ගැනීමට හා එහි ඔප්පු ලියාපදිංචි ගාස්තු සභාව මගින් දැරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. යථාපරිදි කල්දී නොමැති යෝජනා /හදිසියෝජනා - ඇත

06:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2021 වර්ෂයේ ණය හිමි කරන ලද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව වන වල්ලහගොඩ කහටගස්තැන්න ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ අඩුපාඩු ඇති බැවින් ඒ සඳහා අත්තිකාරම් මුදලක් ගෙවිය හැකි බව තාක්ෂණ නිලධාරී මහතා විසින් දන්වා ඇත. ඒ අනුව කර්මාන්තයේ මුළු වටිනාකම වන රුː 1,250,000.00ක මුදලින් 75%ක මුදලක් ගෙවීම සුදුසු බවටත් එයින් 10%ක රැඳවුම් මුදල වන රුː 93,750.00ක මුදලක් සභාව මගින් රඳවා ගෙන ඉතිරි මුදල වන රුː 843,750.00ක අත්තිකාරම් මුදලක් එම කර්මාන්තය ක්‍රියාත්මක කරන ලද ඇත්ගාල රන්කෙත ගොවි සංවිධානය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපතිතුමා

2021 වර්ෂයේ ණය හිමි කරන ලද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව වන වල්ලහගොඩ කහටගස්තැන්න ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ අඩුපාඩු ඇති බැවින් ඒ සඳහා අත්තිකාරම් මුදලක් ගෙවිය හැකි බව තාක්ෂණ නිලධාරී මහතා විසින් දන්වා තිබෙනවා. නමුත් සමිතියේ ඉල්ලීම මත එහි අඩුපාඩු නිවැරදි කර වැඩ අවසන් කිරීම සඳහා කර්මාන්තයේ මුළු වටිනාකම වන රුː 1,250,000.00ක මුදලින් 75%ක මුදලක් ගෙවීම සුදුසු බවටත් එයින් 10%ක රැඳවුම් මුදල වන රුː 93,750.00ක මුදලක් සභාව මගින් රඳවා ගෙන ඉතිරි මුදල වන රුː 843,750.00ක අත්තිකාරම් මුදලක් එම කර්මාන්තය ක්‍රියාත්මක කරන ලද ඇත්ගාල රන්කෙත ගොවි සංවිධානය වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

මූලාසනයේ ගරු සභාපතිතුමනි,මාගේ ධූරකාලයේ දී ගල්පාය මාර්ගයේ මාර්ග තත්ත්ව පරීක්ෂණය අසමත්වීම හේතුවෙන් මුදල්ගෙවීම නතර කරනු ලැබූ අතර දෙවන වර තත්ත්ව පරීක්ෂණය සමත්වුවත් රුපියල් ලක්ෂ දහයක මුදල්ගෙවනු ලැබුවේ නැත. නමුත් මෙම ව්‍යාපෘතියේ නඩත්තු කාලය ද මේ වනවිට ඉක්මවා තිබෙනවා.මේ වසරේ හත්වන මාසය වන විටත් මේ සම්බන්ධයෙන් වැඩ නිසියාකාරයෙන් අවසන් වී නැති නිසා තාක්ෂණ නිලධාරී මහතා මෙම ගෙවීම් සිදුකිරීමට නිර්දේශ කර නැති බව මගේ අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා

සභාපතිතුමනි,අඩුපාඩු සකස් කළත් එය ප්‍රයෝජනයට ගත නොහැකි නම් මුදල් ගෙවීම නිශ්ඵල විය හැකියි.වැඩ අවසන් කළ පසු මුදල් ගෙවීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

ගරු සභාපතිතුමනි,මේවන විට මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් විය යුතු කාලය ඉක්මවා තවත් මාස හතක් ගතවී ඇති බැවින් හා වැසි සමය හේතුවෙන් මාර්ගයට හානි සිදුව ඇත්නම් ඒවා තවත් වැඩි වී තිබිය හැකියි.එම නිසා සම්පූර්ණ වැඩ අවසන් කළ පසු මුදල් නිදහස් කිරීම සුදුසු බව මාගේ අදහසයි.

ගරු සභාපතිතුමා

ඒ අනුව මේ සම්බන්ධයෙන් වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බැවින් ව්‍යාපෘතිය අවසන් කළ පසුව තාක්ෂණ නිලධාරී වාර්තාව සළකාබලා අතරුඳවුම් මුදල් රඳවාගෙන මුදල් නිදහස් කිරීම සුදුසුයි.

තීරණය:-

ඒ අනුව 2021 වර්ෂයේ ණය හිමි කරන ලද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව වන වල්ලහගොඩ කහටගස්තැන්න ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ අඩුපාඩු ඇති බැවින් එම අඩුපාඩු සකස් කර වැඩ අවසන් කිරීමෙන් පසු මාර්ග තත්ත්ව පරීක්ෂාව සිදුකොට ඇත්ගාල රන්කෙත ගොවි සංවිධානය වෙත මුදල් ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07 කාරක සභා වාර්තා සළකා බැලීම

07:01 මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

2022.06.15 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා ගත කරන ලදි. ඒ අනුව 2022 වර්ෂයට අදාළ ආදායම් වියදම් පුරෝකථනයද, 2022 මැයි මස මුළු ලැබීම් රුඃ 5,572,948.16 ක්ද මුළු වියදම රුඃ 5,910,175.80 ක්ද විය. 2022 මැයි මසට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශයද 2022.06.15 වන දින මහනුවර විගණන අධිකාරී වෙත යොමුකර ඇත.

08. සභාවේ මාසික ලැබීම් හා ගෙවීම් වාර්තාව

2022.06.15 සිට 2022.06.17 දක්වා ගෙවීම් වාර්තාව සභාගත කරන ලදි.

09. වෙනත්

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා අසනීපවීම හේතුවෙන් අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

එම නිවාඩු ඉල්ලීම අනුමත කරන ලදි.

ගරු සභාපතිතුමා

අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්තවන බව ප්‍රකාශ කරන ලදි. අද දින සභාවාරය සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබාදුන් සියලුදෙනාටත් ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයේ සියලුදෙනාටත් ස්තූතිවන්ත වෙමින් ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු පෙ:ව: 12.30 ට අවසන් කරන ලදි.

**සභාපති**

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව**

**2022.06.21 වන දින ගඟ ඉහළ කෝරළේ**

**ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදීය**